යම් අයෙකුට නැරඹීමට අපහසුතාවයක් හෝ කම්පනයක් ඇති වන ආකාරයේ සංවේදී ඡායාරූප පුවත් වාර්තාවන් හා පළ කළ යුතුද? මෙහිදී මෙම අපහසුතාවය හෝ කම්පනය යන්න පුද්ගලානුබද්ධ විය හැකි වුවත්, එය නැරඹිය නොහැකි පාඨකයන් සිටින්නේ නම් සහ එම ඉදිරිපත් කරනා සංවේදී ඡායාරූප මගින් සිදුවීම හා බැඳි සමස්ත සමාජ ගැටළුව සම්බන්ධ කතිකාවකට ඍජු දායකත්වයක් ලබා නොදෙන්නේ නම්, එම ඡායාරූප පළ කිරීම සාධාරණීකරණය කළ හැකිද?

මෙහිදී සැලකිලිමත් විය යුත්තේ, ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ ඡායාරූප, අවශ්‍ය සංවේදීතාවෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම, පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්වද ඉදිරිපත් කිරීමට පුවත්පත විශේෂයෙන් සැලැකිලිමත් විය යුත්තේය යනුවෙන් මාධ්‍ය ආචාර ධර්ම මාර්ගෝපදේශයන්හි දැක්වෙන බවයි.

එසේ ගත් විට, මෙම දිවයින පුවත්පතේ ලිපි කිහිපයක් සමගින් පළවූ සංවේදී ඡායාරූප පළ කිරීම අත්‍යාවශ්‍යද යන්න පාඨක අප නැගිය යුතු පැනයයි.
#MediaEthicsSL #lkr #SundayDivaina